ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
இலங்கை காப்புறுதி ஒழுங்குமுறைப்படுத்தல் ஆணைக்குழு
INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

INSURANCE REGULATORY COMMISSION OF SRI LANKA

11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01, ශ්‍රී ලංකාව.

11ம் மாடி, கிழக்கு கோபுரம்
உலக வர்த்தக மையம்
கொழும்பு 01, இலங்கை.

Level 11, East Tower
World Trade Centre
Colombo 01, Sri Lanka.

+94 11 2396184-9
+94 11 2396190
www.ircsl.gov.lk

# ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

## විශේෂ නිවේදනය

ශ්‍රී ලංකාවේ දැනට පවතින කොවිඩ්-19 (Covid-19) වසංගතය හේතුවෙන් අහිතකර බලපෑම්වලට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයින් සඳහා සහන සැලසීමට අතිගරු ජනාධිපතිතුමා විසින් දුන් උපදෙස් පරිදි ගනු ලැබූ කැබිනට් මණ්ඩල තීරණයකට අනුව, රක්ෂණ ඔප්පුහිමියන් සඳහා සහන සැලසීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව තීරණය කර ඇත.

ඒ අනුව, රක්ෂණ සමාගම් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව පහත සඳහන් සහන සියළුම රක්ෂණ ඔප්පුහිමියන් වෙත ලබාදීමට රක්ෂණ සමාගම් වෙත උපදෙස් ලබා දී ඇත:

i. සියළුම සාමාන්‍ය රක්ෂණ ඔප්පුහිමියන් සඳහා රක්ෂණ වාරික ගෙවීමට, රක්ෂණ ඔප්පුව ක්‍රියාත්මක වන දිනයේ සිට මාස 03 ක සහන කාලසීමාවක් ලැබේ. මෙම සහන කාල සීමාව වලංගු වන්නේ 2020.03.01 දින සිට 2020.06.30 දින දක්වා කාල සීමාව තුළ ක්‍රියාත්මක වූ/ ක්‍රියාත්මක වන රක්ෂණ ඔප්පු සඳහා පමණි;

ii. සියළුම ජීවිත රක්ෂණ ඔප්පුහිමියන් සඳහා රක්ෂණ වාරික ගෙවීමට, රක්ෂණ ඔප්පුවේ සඳහන් වාරික ගෙවීමට නියමිත වූ දිනයේ සිට මාස 03 සහන කාලසීමාවක් ලැබේ. මෙම සහන කාලසීමාව වලංගුවන්නේ 2020.03.01 දින සිට 2020.06.30 දින දක්වා කාලසීමාව තුළ වාරික ගෙවිය යුතු දිනය ඇතුලත්වන්නේ නම් පමණි;

iii. මෙම සහන කාලසීමාව තුළ රක්ෂණ ඔප්පු ප්‍රාණවත්ව පවතින හෙයින්, රක්ෂණ ඔප්පුවේ (ජීවිත හා සාමාන්‍ය) සඳහන් ප්‍රතිලාභ වලට කිසිදු බලපෑමක් සිදු නොවේ.

Damayanthi Fernando

දමයන්ති ප්‍රනාන්දු
**අධ්‍යක්ෂ ජනරාල්**

2020.04.10